10
00520

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

විද්‍යාවේදී උපාධි පාඨමාලාව

අවසන් පරීක්ෂණය – 3 වන මට්ටම 2019/2020

**LLU3261/LWU1161 - නීතිය පිළිබඳ අවබෝධය හා සංකල්ප**

කාලය - පැය දෙක (02) යි.

---

දිනය - 2019 දෙසැම්බර් 20 වන දින　　　　වේලාව - ප.ව.02.00 – 04.00 දක්වා

---

ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.
අපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.

01. i. රිට් ආඥා වර්ග සහ ඒවායේ කාර්යයන් මොනවා ද? (ලකුණු 10)

ii. ශ්‍රී ලංකාවේ නීති මූලාශ්‍ර වශයෙන් ව්‍යවස්ථා, අධිකරණය, සිරිත් , නීතිවේදීන්ගේ මත සහ සාධාරණත්වය යන්නෙහි වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 15)

02. i. ශ්‍රී ලංකාව සහ එංගලන්තය ආශ්‍රයෙන් පාර්ලිමේන්තු ස්වාධිපත්‍ය යන සංකල්පය සංසන්දනාත්මකව විග්‍රහ කරන්න.
ඔබගේ පිළිතුර යෝග්‍ය නිදර්ශන ඇසුරෙන් තහවුරු කරන්න. (ලකුණු 15)

ii. බලතල බෙදීමේ සිද්ධාන්තය සහ එහි වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

03. i. ශ්‍රී ලංකාවේ දැනට පවතින අධිකරණ ධූරාවලිය සහ එහි කාර්යයන් පැහැදිලි කරන්න.(ලකුණු 15)

ii. දිසා අධිකරණ සහ මහාධිකරණවල බලතලයන්හි වෙනස්කම් පැහැදිලි කරන්න. (ලකුණු 10)

04. i. ද්‍රවිඩ ජාතිකයකු වූ රාජේෂ් 1960 දී දකුණු ඉන්දියාවේ චෙන්නායිහිදී උපත ලැබීය. ඔහුට වයස අවුරුදු දෙකේදී ඔහුගේ දෙමාපියන් යාපනයට පැමිණි අතර ඔහු එහිදී පාසල් අධ්‍යාපනය ලැබීය. වයස අවුරුදු 18 වන විට පාසල් කාලය නිමවීමෙන් පසු ඔහුට ගුරුවරයකු ලෙස කොළඹින් රැකියාවක් ලැබිණි. ඔහු සෑම සති අන්තයේ දීම සිය දෙමාපියන් බැලීම සඳහා පැමිණියේ ය. වර්ෂ 1990 දී ඔහු ෂායා නම් වූ කොළඹ ප්‍රදේශයේ ද්‍රවිඩ කාන්තාවක් සමග විවාහ වූ අතර ඇයගේ දෙමාපියන්ගේ නිවසේ ජීවත් විය. රාජේෂ් යාපනයේ ඉඩම් කැබැල්ලක් මිලදී ගෙන එහි නව නිවසක් තැනීම ආරම්භ කළේය. නිවාඩු ලබා ගත හැකි සෑම අවස්ථාවක දීම ඔහු යාපනයට ගොස් එහි නතර වී සිටියේ ය. එසේම යාපනයට ස්ථාන මාරුවක් ලබා ගෙන එහි ජීවත්වීමට ඔහුට අවශ්‍ය වුවද කොළඹ අතහැර යාපනයේ ස්ථිරව පදිංචිවීම ෂායා ප්‍රතික්ෂේප කළාය. 2018 වර්ෂයේදී රාජේෂ් රිය අනතුරකින් මිය ගියේය.
රාජේෂ්ගේ දේපළ සම්බන්ධව අදාළ වන නීතිය සාකච්ඡා කරන්න. (ලකුණු 15)

ii. ප්‍රාදේශීය නීති සහ පෞද්ගලික නීති යන ඒවායේ වෙනස්කම් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

05\. i. නවීන් තම මෝටර් රථය කොළඹ කුළීරථ ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන මයික්‍රො කැබ් සහ සමාගමට කුලියට ලබා දුන්නේ ය. නවීන් මෝටර් රථය නඩත්තු කරනු ලැබූ අතර, මාසය තුළ බාරගන්නා ලද කුලී ප්‍රමාණය පදනම් කොට ගෙන ඔහුගේ ගෙවීම් ප්‍රමාණය ගණනය කරන ලදී. ඔහු විසින් සමාගමේ වර්ණයෙන් මෝටර් රථය වර්ණ ගැන්විය යුතු වූ අතර, එහි සමාගම් ලාංඡනයද ඇතුළත් කළයුතු විය. එසේම ඔහු විසින් සමාගමේ නිළ ඇඳුම පැළඳ සිටිය යුතු විය. එසේම මෝටර් රථය සම්පූර්ණයෙන්ම සමාගමේ සේවය සඳහා යෙදවිය යුතු විය.

මයික්‍රො කැබ් සහ සමාගම කිසිදු හේතු දැක්වීමකින් තොරව නවීන් සමඟ පැවති ගිවිසුම අවසන් කළේය.

නවීන්ට උපදෙස් දෙන්න. (ලකුණු 15)

ii. ආරවුල් නිරාකරණය කිරීමේ ක්‍රමවේදයක් වශයෙන් කම්කරු විනිශ්චය සභාවක ඇති ඵලදායිත්වය පැහැදිලි කරන්න. (ලකුණු 10)

06 පහත සඳහන් ඕනෑම දෙකක් පිළිබඳව කෙටි සටහන් ලියන්න.

i. අගනා ප්‍රතිෂ්ඨාව සහ සාධාරණ හේතුව
ii. මූලික අයිතිවාසිකම් මත වන සීමා කිරීම්
iii. අර්පණයේ විවිධ මාදිලි
iv. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා වර්ගීකරණය (ලකුණු 25)

07\. "සේවක අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට හා ඔවුන්ගේ සුභසාධනය සහතික කිරීම සඳහා ශ්‍රී ලංකා රජය සාර්ථකව විවිධ නීතීන් ක්‍රියාවට නංවා තිබේ."

අදාල පනත් සමගින් ඉහත ප්‍රකාශය සාකච්ඡා කරන්න. (ලකුණු 25)

08\. i. තම අප්‍රේල් නිවාඩුව ගත කිරීම සඳහා දයාල් සහ ගයනි කතරගම ගිය හ. 'ග්‍රෑන්ඩ් රෝයල්' නම් වූ හෝටලයක නැවතීමට ඔවුන් තීරණය කරන ලදී. දින හතරක් සඳහා කාමර ගාස්තු ගෙවූ ඔවුහු, ඔවුන්ට නියමිත කාමරයට ගියහ. ඔවුන් කාමරයට ඇතුළු වූ විට "සොරකම් කරනු ලබන හෝ නැතිවන භාණ්ඩවලට හෝටලයේ කළමනාකාරිත්වය වග කියනු නොලැබේ." යනුවෙන් වූ දැන්වීමක් ඔවුන් දුටුවේය. ඔවුන් පිටව යන දින හෝටලයෙන් පිටත්ව යාමට සූදානම් වූ අවස්ථාවේ දී, තමාගේ රන්මුදුව නැතිවී ඇති බව දයාල් දැනගත්තේ ය. හෝටලයට විරුද්ධව නඩු පැවරීමට දයාල් අදහස් කරයි.

දයාල්ට උපදෙස් දෙන්න. (ලකුණු 15)

ii. නීත්‍යානුකූලව බලාත්මක කලහැකි ගිවිසුමක් නිර්මාණය කිරීමෙහි ලා සපුරාලිය යුතු මූලිකාංග කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

හිමිකම ඇවිරිණි.